පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 08

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

පාසලේ නම : ................................................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය : පැය 02යි.

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01.හරිහැටි ඉගෙනීම නොලැබූ ළමයාට කළ වියදම් <u>ගඟට ඉනි කැපුවා මෙන්</u> වූ බව තාත්තා කීවේය.

1. ඉනි කපා ගඟට දැමීම. 2. ප්‍රයෝජනවත් ක්‍රියාවක් කිරීම.

3 . බුද්ධිමත් ක්‍රියාවක් කිරීම. 4. නිශ්ඵල ක්‍රියාවක් කිරීම.

02. රියදුරා තම රථය <u>ලැල්ලට පාගා</u> පැදවූයේය.

1. අධික වේගයෙන් 2. ලැල්ලක් මතින්

3. ලැල්ලක් අසලින් 4. ලැල්ලක් රථයේ තබාගෙන

පහත ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

03. **නුහුරු දෙයක් කිරීමට ගොස් අමාරුවේ වැටීම.**

1.ගඟට ඉනි කැපුවා වගේ. 2.අන්දරේ සිනි කෑවා වගේ.

3.අබරා සිල් ගත්තා වගේ. 4.අන්ධයෝ ඇතාගේ හැටි කීවා වගේ.

04. මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනය වන්නේ,

1.සංවර්ධනය 2.අබරණ 3. ස්තූපය 4. උච්චාරණය

05. වැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1.ඇත් රළ 2.සොර මුළ 3. බලා වැළ 4. බිඟු කැළ

06.අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති වරණය වන්නේ,

1.කිරි දරුවා,කිරි නැනා,කිරි කිත්තා,කිරි කෑ මුත්තා 2.කිරි කිත්තා,කිරි කෑ මුත්තා,කිරි දරුවා,කිරි නැනා

3.කිරි කෑ මුත්තා,කිරි කිත්තා,කිරි දරුවා,කිරි නැනා 4.කිරි නැනා,කිරි දරුවා,කිරි කෑ මුත්තා,කිරි කිත්තා

07.“ හනික <u>වරෙව්</u> කොල්ලනේ - මෙන්න මෙහෙ වරෙව්” මෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ,

1.මිශ්‍ර ක්‍රියා 2. විධි ක්‍රියා 3. පූර්ව ක්‍රියා 4. ආශිර්වාද ක්‍රියා

08.“නා” යන බහ්වර්ථ පදයෙහි අර්ථයක් නොවන්නේ,

1. නා ගස 2. නායක 3. නාමය 4. නාග

09. තද්ධිත නාම පදයක් වන්නේ,

1.බලවත් 2.කිරිබත් 3.පන්සිල් 4.ඇත්දළ

10. "දෙරණ පළා රතු කැට මතු වන්නට" මෙහි නාම විශේෂණ පදය වන්නේ,

1.දෙරණ 2. රතු 3.කැට 4.පළා

11.පර්යාය පදයක් සහිත වරණය තෝරන්න.

1.උපුල-කමල 2.ඉඳුවර-දිනිති 3.ධරණි-වසුන්දරා 4.අරවින්ද-ශාලුක

12. විරුද්ධාර්ථ පදයක් සහිත වරණය වන්නේ,

1.සැප-සනීප 2. අඳුර-රාත්‍රිය 3. සුදන-දුදන 4. මීරිදිය-පිනිදිය

13. උක්ත පද සහිත වරණය තෝරන්න.

1.මිනිසෙක්,මිනිසෙකු,මිනිසා 2.සිසුවෙක්,සිසුවා,සිසුන්

3. ගොවියෝ,ගොවියා,ගොවියෙක් 4.ගැහැනුන්,ගැහැනියක,ගැහැනියක්

- **පහත දක්වා ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

14. ඔවුහු තරගයෙන් ජය .................................

1.ලැබුහ. 2.ලැබීමු. 3.ලැබුවා ය. 4.ලැබුවේ ය.

15. ................................මහජනයාගේ දුක සැප විමසා බැලුවේ ය.

1.ජනාධිපතිතුමා 2.ජනාධිපතිනිය 3.ජනාධිපතිවරු 4.ජනාධිපතිනියක්

16..................................මල් නෙළන්නීය.

1.ඇය 2.ඔහු 3.නුඹ 4.අපි

- **ඉරි ඇඳි පදවල නිවැරදි අර්ථය දැක්වෙන වරණය තෝරන්න.**

17."කවුද මේ <u>කැනහිලු</u> -මුව මම වනසමි"

1.හිවලා 2.ගොනා 3.ගවයා 4. බූරුවා

18."වඩාත් <u>පෘථුල</u> වූ ජීවන දර්ශනයක් ඔහුට ලබා දුන්නා සේය."

1. වැදගත් 2.පටු 3. පුළුල් 4.නිවැරදි

19. ලෝවැඩ සඟරාවේ කතුවරයා වන්නේ,

1.තොටගමුවේ ශ්‍රී රාහුල හිමි 2.වෑත්තෑවේ හිමි

3.වීදාගම මෛත්‍රේය හිමි 4.රණස්ගල්ලේ හිමි

20."රන් කැකිර හා තවත් කතා" නම් කෘතියෙහි රචකයා වන්නේ,

1.රෝහණ දන්දෙණිය 2.ඒ.පී.ගුණරත්න

3.රෝහණ බැද්දගේ 4.විමලරත්න අදිකාරි

(ලකුණු 40යි)

## II කොටස

01 පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. රිය අනතුරු වළකමු.

ii. ඉගෙනීම නොනැසෙන ධනයයි.

iii. නීරෝගී බව උතුම් ලාභයයි.

iv. අපද්‍රව්‍ය කළමනාකරණය (ලකුණු 20යි)

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "ඒ අයට ඉංග්‍රිසි ආණ්ඩුවේ අනුග්‍රහය තියනවා නේද?."

(අ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙය කවුරුන් විසින් ප්‍රකාශ කරන ලද්දක්ද?

(ඇ) කා හට ප්‍රකාශ කරන ලද්දක්ද?

ii. "මේක කාටත් පොරෝජන වෙන දෙයක් හරිද?"

(අ) මෙය කා විසින් ප්‍රකාශ කරන ලද්දක්ද?

(ආ) මෙය ප්‍රකාශ කරන තැනැත්තා "මේක" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ඇ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

iii. " හරි පුදුමයිනෙ තාත්තේ. මම දැනගෙන හිටියේ නැනේ ඒ බව!"

(අ) මෙය කවුරුන් විසින් ප්‍රකාශ කළේද?

(ආ) මෙම තැනැත්තා නොදැන සිටි කාරණය කුමක්ද?

(ඇ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

iv. "අනේ බං...උඹැහෙගේ ඔය ඉවිල්ල , ඕකත් මහ කජ්ජක් ද බොලං?"

(අ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙය කා හට ප්‍රකාශ කරන ලද්දක්ද?

(ඇ) මෙම පාඨය ඇතුළත් නාට්‍ය කුමක්ද?

v. අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
..........................................

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පාදය සම්පූර්ණ කරන්න.

(ආ)මෙහි මඟුල් ගෙවල් දෙකක් ලෙස දක්වා ඇති ස්ථාන මොනවාද?

(ඇ) මෙම පද්‍යයේ රචකයා කවුද? (ලකුණු 15යි)

03.පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෙර දිග ලෝකයේ බබළන මුතු ඇටය
පණ ඇති මහා සමුදුර පවුරෙන් වටය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ රටය
ලොව අන් සියලු දිවයින් මේකට යටය

මහවැලි කැලණි වලවේ කළු යන ගංගා
සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා
බැවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට හංගා

i. මෙහි මා ඉපදුන රට වශයෙන් දක්වා ඇත්තේ කුමක්ද?

ii. මෙහි කියවෙන ගංගා හතරේ නම් මොනවාද?

iii. මෙහි පණ ඇති සේ සලකා ඇත්තේ කුමකටද?

iv. මෙහි සඳහන් උත්තම පුරුෂ අනුක්ත නාම පදයක් හා නාම විශේෂණ පදයක් ලියන්න.

v. පහත යෙදුම්වලට සමාන සුදුසු පද ගීතයෙන් තෝරා ලියන්න.

(අ) දූපත (ආ) ප්‍රාකාරය (ලකුණු 10යි)

04. දිනෙන් දින ඉහළ යන ඩෙංගු උවදුරෙන් ගැලවීම සඳහා ඔබ පාසලෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

**නැතහොත්**

ඔබ ගමේ ළමා සමාජයේ ලේකම් යැයි සිතා එමගින් සිදු කෙරෙන ඩෙංගු මර්දන වැඩසටහනට සමගාමීව ගම්වාසීන් දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීමට ආරාධනා කරමින් ප්‍රදේශයේ රෝහල් වෛද්‍ය අධිකාරීතුමා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න.

(ලකුණු 15යි)